# ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 03


## I ප්‍රශ්න පත්‍රය


100

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. කාලය: මිනි: 45

■ අංක 01 හා 02 ප්‍රශ්නවල මුලින් දී ඇති රූපයට වඩාත් කිට්ටු සම්බන්ධයක් ඇති රූපය තෝරන්න.

01.






(1)




(2)




(3)

02.






(1)




(2)



(3)

■ 03 හා 04 ප්‍රශ්නවල සම්බන්ධතාවය අඩුම රූප යුගලය ඇති කොටුව තෝරන්න.


03.



(1)



(2)




(3)

04.



(1)



(2)



(3)

PAPERMASTER.LK

05. නිවැරදි අක්ෂර සහිත වචනය කුමක්ද?


(1) ප්‍රදර්ශනය (2) මර්ධනය (3) විස්මිත

06. මෙයින් පෙන්වන වේලාවට පැය 1යි මිනිත්තු 40ට පසු වේලාව කීයද?

(1) 6.35

(2) 6.25

(3) 6.30




07.

| | | | | |
|---|---|---|---|---|
| 7 | 9 | 12 | 16 | A |

මෙහි A ට සමාන කළ හැකි සංඛ්‍යාව කුමක්ද?

(1) 20 (2) 21 (3) 22


08. පෝලිමක නිමල්ට ඉදිරියෙන් 14 දෙනෙක් ද ඔහුට පිටුපසින් 16 දෙනෙක් ද සිටිති. පෝලිමේ සිටින ගණන කීයද?


(1) 30 (2) 29 (3) 31

09. ළමයෙක් දකුණු දිශාවට මීටර 100ක දුරක් ගමන් කර එතැනින් නැගෙනහිරට තවත් මීටර 50ක දුරක් ගමන් කරයි. නැවත උතුරු දිශාවට මීටර 100ක දුරක් ගමන් කර නවතී. ළමයා මුලින් සිටි ස්ථානයත් දැන් සිටින ස්ථානයත් අතර දුර කොපමණද?

(1) 100m (2) 200m (3) 50m


■ **මුල් රූපයේ ඇති හැඩතල සියල්ලම ඇති රූපය තෝරා යටින් ඉරක් අඳින්න.**




10. 



(1) (2) (3)

PAPERMASTER.LK

11. 

(1) (2) (3)

■ **කොටුවේ ඇති සංඛ්‍යා වෙනුවට ආදේශ කළ හැකි සංඛ්‍යා සහිත පිළිතුර තෝරන්න.**




12. 5 + [4 - 2] = 7

(1) [2 x 1] (2) [5 - 1] (3) [6 ÷ 2]

13. 10 - [2 x 5] = 0

(1) [7 + 3] (2) [5 + 4] (3) [0 - 10]

■ **පහත දැක්වෙන්නේ පලතුරු කිහිපයක මිලයි. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

රු. 225.00 රු. 100.00 රු. 150.00

14. අන්නාසි ගෙඩි 3ක මිල කීයද?

(1) රු. 150.00 (2) රු. 200.00 (3) රු. 50.00

15. අන්නාසි ගෙඩියක් මිලදී ගන්නා මුදලින් දොඩම් ගෙඩි කීයක් මිලදී ගත හැකිද?

(1) තුනයි (2) දෙකයි (3) පහයි

PAPERMASTER.LK

- **මුලින් දී ඇති වචනයට අර්ථයෙන් සමාන නොවන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

16. ඉර - (1) සූර්යයා (2) දිනකර (3) සොමි

17. චන්ද්‍රයා - (1) හඳ (2) සිසි (3) ගුවන

18. කේක් ගෙඩියක් සමාන කොටස් 8කට කෑලි කපා විකුණුවේය. එක කෑල්ලක මිල රුපියල් 40කි. කේක් ගෙඩියේ මුළු වටිනාකම කීයද?


(1) රු. 360.00 (2) රු. 380.00 (3) රු. 320.00

- ශාලාවක මිනිස්සු 88ක් සිටිති. එයින් $\frac{1}{2}$ ක් ගැහැනුය. ඉතිරි සංඛ්‍යාවෙන් $\frac{1}{2}$ක් පිරිමිය. ඉතිරි අය ළමුන්ය. 19. ශාලාවේ සිටින පිරිමි සංඛ්‍යාව කොපමණද?

(1) 11 (2) 22 (3) 44

20. ශාලාවේ සිටින ගැහැනු සංඛ්‍යාවෙත් ළමුන් සංඛ්‍යාවෙත් එකතුව කීයද?

(1) 11 (2) 22 (3) 66




21. සෘජුකෝණාස්‍රයට පමණක් අයිති ඉලක්කම් මොනවාද?

.................................................................................................

22. සෘජුකෝණාස්‍රයට, ත්‍රිකෝණයට සහ සමචතුරස්‍රයට අයිති ඉලක්කම කුමක්ද? .................................................................................

PAPERMASTER.LK

23. පාරේ ඇති කණු දෙකක් අතර කොඩිවැල් දෙක බැගින් දමා ඇත. කණු 10ක් අතර ඇති කොඩි වැල් ගණන කීයද?

(1) 20 (2) 18 (3) 22

24. සීනි 1kg 250g ක මිල රුපියල් 140කි. සීනි 500g ක මිල කොපමණද?

(1) රු. 56.00 (2) රු. 52.00 (3) රු. 48.00

25. මිනිත්තු 300ක් යනු පැය කීයද?

(1) පැය 3 (2) පැය 6 (3) පැය 5

26. 20 සිට 25 දක්වා සංඛ්‍යා ලියූ විට 2 ඉලක්කම යෙදෙන වාර ගණන කීයද?

(1) 7 (2) 4 (3) 6

27. මෙයට සම කළ හැකි පිළිතුර තෝරන්න.

| 17 x 3 |
|---|

(1) 12 + 24 (2) 17 + 34 (3) 50 - 19

28. A ළඟ රුපියල් 65ක මුදලක් ඇත. එමෙන් 4 ගුණයක මුදල් B ළඟ ඇත. දෙදෙනා ළඟම ඇති මුදල කොපමණද?

(1) රු. 360.00 (2) රු. 325.00 (3) රු. 350.00

29. ටැංකියක ජලය ලීටර 1ක් ඇත. එහි ඇති සිදුරකින් මිනිත්තුවකට ජලය මිලිලීටර 50 බැගින් කාන්දු වේ. භාජනය හිස්වීමට කොපමණ වේලාවක් ගතවේද?

(1) මිනිත්තු 25 (2) මිනිත්තු 40 (3) මිනිත්තු 20

PAPERMASTER.LK

30. තාත්තාගේ වයස පුතාගේ වයස මෙන් පස් ගුණයකි. තාත්තාගේ වයස අවුරුදු 45 නම් පුතාගේ වයස කීයද?

(1) අවුරුදු 8 (2) අවුරුදු 7 (3) අවුරුදු 9

31. 'පත්තරය' යන වචනයේ අකුරු යොදාගෙන ලියා ඇති වචනය කුමක්ද?


(1) තප්පර (2) යත්ත (3) තරහ

32. ඇපල් ගෙඩි 4 + අඹ 2 = රුපියල් 160.00

අඹ ගෙඩියක මිල රුපියල් 30ක් නම් ඇපල් ගෙඩියක මිල කීයද?

(1) රු. 40.00 (2) රු. 35.00 (3) රු. 25.00

33. රටාවේ හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව සොයන්න.





(1) 13 (2) 12 (3) 8

34. තේ කොළ 100g ක මිල රුපියල් 120කි. තේ කොළ 150g ක මිල කීයද?

(1) රු. 180.00 (2) රු. 140.00 (3) රු. 200.00


35. සමමිතියක් ඇති රූපය තෝරන්න.



(1) (2) (3)

PAPERMASTER.LK

36. මෙම රූපයෙන් $\frac{1}{5}$ක් පෙන්වීමට කොටු කීයක් අඳුරු කළ යුතුද?



(1) 2 (2) 6 (3) 3

37. 97, 68, 79, 64, 89 මෙම සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියූ විට මැදට එන සංඛ්‍යාව කුමක්ද?

(1) 79 (2) 89 (3) 68

- **පහත දී ඇති පද වාක්‍යවල යෙදෙන ආකාරය බලා එහි අංකය රවුම් කරන්න.**

38. ලස්සන, හොඳ, උසස්

(1) නාම පද (2) නාම විශේෂණ (3) ක්‍රියා පද

39. ගයයි, කරයි, බලයි

(1) ක්‍රියා පද (2) නාම පද (3) නාම විශේෂණ

40. අම්මා, ගුරුතුමා, ළමයා

(1) සත්ත්ව නාම (2) ස්ථාන නාම (3) පුද්ගල නාම

PAPERMASTER.LK

| | |
|---|---|
| **2021 නව විෂය නිර්දේශයට අනුව සකස් කළ**<br>**ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර - 03**<br>**II ප්‍රශ්න පත්‍රය**<br>**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.** **කාලය: පැය 1 මිනි: 15** | 100 |

- **පහත කවිය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට කවියෙන්ම සොයා පිළිතුරු සපයන්න.**

වෙරළ වටා මුතුපර වැටියයි
ඉන්දීය සයුරේ මුතු ඇටයයි
පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ

රත්නදීප පොළොව තුළින්
ධන නිධාන මතු වේ
මහවැලි නිල්වලා ගඟයි
කළු වලවේ කැලණි ගඟයි

(1) මුතුපර වැටිය ඇත්තේ කොහේද? ........................................

(2) මෙම කවිපෙළ රචනා කළේ කවුද? ........................................

(3) පසට යට වී ඇත්තේ මොනවාද? ........................................

(4) කවි පෙළෙහි සඳහන් ගංගා 2ක් නම් කරන්න. ........................................

(5) පහත වචනවලට සමානාර්ථ දෙන වචන කවියෙන් සොයා ලියන්න.

1. දෙරණ - ............................ 2. මුහුදේ - ............................

(6) ශ්‍රී ලංකාව හඳුන්වන වැකියක් කවි පෙළෙන් සොයා ලියන්න.

........................................................................................

(7) දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍ය ගොඩනගන්න.

1. ලුණු මිදෙල්ල / වියළි / නැග එයි / කොළ මතට / සර සර / වැටී මෙන් / නාදය / ගෙඩි

........................................................................................

2. ඇදෙයි / ගංගා / වෙත / සාගරය

........................................................................................

3. පුතේ! / හොඳයි / මයෙ / මට / මෙහෙම

........................................................................................

PAPERMASTER.LK

(8) පහත වාක්‍ය සම්පූර්ණ කිරීමට අවශ්‍ය නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න. ලියන්න.

1. බෞද්ධයෝ ................................ (පස්පව්/පස්පවු) වලින් වැළකී සිටිති.

2. අහසේ තාරකා ........................... (බබලයි/බබළයි)

3. සමනලයෝ මල් ......................... (පැණි/පැනි) සොයා පියඹති.

4. ගස්වැල් ....................................... (සුලඟට/සුළඟට) වැනුණි.

5. පවනි සියලු දෙනාට ම ............... (ප්‍රශ්ණ/ප්‍රශ්න) පත්‍රය බෙදා දුන්නා ය.

(9) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

1. ගඟට ............................................ කැපුවා වගේ.

2. කොහොඹ ගහට .............................. වැල ගියා වගේ.

3. ..................................................... කරේ රත්තරන් බැන්දා වගේ.

(10) වාක්‍යවලට ගැළපෙන ආඛ්‍යාත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

1. ආච්චි මල්ලිට කතන්දරයක් .................................. (කීවා ය/කීවේ ය)


2. ගුරුවරයා පන්තියට ................................. (පැමිණියා ය/පැමිණියේ ය)

3. ශිෂ්‍යයෝ ප්‍රදර්ශනය ............................. (නැරඹුවෝ ය/නැරඹුවේ ය)

4. අක්කා ගෙදර එනතුරු අපි මඟ බලා .................... (සිටියෙමු/සිටියෙමි)

5. තාත්තා උදෑසන ම කුඹුරට .................................. (ගියා ය/ගියේ ය)

(11) පහත දී ඇති රූපයේ ලකුණු කර ඇති කොටස් සඳහා ඉංග්‍රීසියෙන් භාවිත කරන නම් ඉංග්‍රීසියෙන් ලියන්න.




A .................

B .................

(12) නිවැරදිව ලියා ඇති වචනය යටින් ඉරක් අඳින්න.

1. Temple / Tample / Templa


2. Ballon / Ballum / Balloon

(13) පහත වාක්‍ය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය ඉංග්‍රීසියෙන් ලියන්න.

අපි කඩුලැල්ල ළඟට දුවමු - ...............................................................

PAPERMASTER.LK

(14) පහත රූපවලට දෙමළ භාෂාවෙන් කියන ආකාරය සිංහල අකුරින් ලියන්න.

1. 

2. 

.................................... ....................................

(15) සිංහල තේරුම ලියන්න.

එනක්කු තණ්ණීර් වේණ්ඩාම් - ....................................................................

(16) පහත සිංහල වැකියේ අදහස දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

ඔබේ නම කුමක්ද? - ..............................................................................


(17) 'මට ජපානයට යෑමට ලැබුණොත්' යන මාතෘකාව යටතේ වැකි 03ක් ලියන්න.

1. ..............................................................................................

2. ..............................................................................................

3. ..............................................................................................

■ **අංක 18 සිට 30 තෙක් දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.**
ගණක රාමුව ඇසුරින් පිළිතුරු සපයන්න.




(18) මෙම ගණක රාමුවෙන් දැක්වෙන සංඛ්‍යාව ලියන්න.
..................................................................


(19) මෙහි සියයස්ථානයේ ඇති ගණක මගින් දැක්වෙන අගය කීයද? ..................................................

(20) ගණක රාමුවේ සංඛ්‍යාව විහිදුවා ලියන්න. ..................................................

(21) IV + VI එකතුව රෝම සංඛ්‍යාවෙන් ලියන්න. ..................................................

(22) $\frac{1}{4} + \frac{1}{4}$ = ..............................................................................

(23) 500m + 1km = ..............................................................................

(24) 


A භාජනයෙන් පස් වතාවක් ජලය B භාජනයට දැමූ විට එය සම්පූර්ණයෙන්ම පිරී යයි. B භාජනයේ ධාරිතාව ලීටර් හා මිලිලීටරවලින් ලියන්න. ..................................................

(25) මිනිසෙකුගේ දෛනික වැටුප රු. 625.00කි. ඔහු සතියකට දින 6ක් වැඩ කරයි නම් ඔහුගේ සතියක වැටුප කොපමණද? ..................................................

PAPERMASTER.LK

(26) ලණුවක දිග මීටර් 02 සෙන්ටිමීටර 70කි. එයින් සෙන්ටිමීටර 80ක කැබලි 3ක් කපා ඉවත් කළ විට ඉතිරි කොටසෙහි දිග කොපමණද? ................................

(27)





රූපයේ පරිදි මීගමුවේ සිට කොළඹට ඇති දුර කොපමණද? ..........................

(28) පහත දී ඇති බිල්පතෙහි හිස්තැන් පුරවන්න.

| ද්‍රව්‍යය | ප්‍රමාණය kg | ඒකක මිල (1kg) | | මුදල | |
|---|---|---|---|---|---|
| | | රු. | සත | රු. | සත |
| 1. අල | 3 kg | 120 | 00 | 360. | 00 |
| 2. ලූනු | 2 kg | 160 | 00 | .......... | ..... |
| 3. සුදු ලූනු | 500 g | ........ | ........ | 113 | 00 |
| 4. හාල් | ........... | 83 | 00 | 332 | 00 |
| | | එකතුව | | 1125 | 00 |

(29) සුපුන්ගේ වයස සමන්ගේ වයසින් අඩකි. සජිත් සුපුන්ට වඩා මාස 4ක් වැඩිමහල්ය. සමන්ගේ වයස අවුරුදු 12 මාස 8ක් නම් සජිත්ගේ වයස කීයද?
...........................................................................................................

(30) පස්වරු 2.45 ඩිජිටල් ඔරලෝසුවෙහි පෙනෙන ආකාරය දක්වන්න.




■ **31 - 60 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

(31) පිරිසක් එකට එකතු වී සාමූහිකව කරන කාර්යයක් නොවන්නේ,

1. නිවසක පොල් අතු බැඳීම. 2. පුස්තකාලයක පොත් කියවීම.

3. කුඹුරක ගොයම් සිටුවීම.

(32) ආහාර රසවත් කිරීමට යොදා ගත හැකි වන්නේ,

1. කොහොඹ දළු 2. රම්පේ කොළ 3. බිලිං කොළ

(33) අනාරක්ෂිත ස්ථානයක් නොවේ.

1. පදිකයන් මාරුවන සුදු ඉර 2. අලි ඇතුන් ගමන් කරන මංකඩ

3. නායයන ස්ථානයක්

(34) පොකුරු කාණ්ඩයට අයත් මලක් වන්නේ,

1. සමන්පිච්ච 2. දාස්පෙතියා 3. රෝස

PAPERMASTER.LK

(35) කම්මල් කර්මාන්තයේ දී රත් වූ යකඩයක් අල්ලා ගැනීමට යොදාගත හැක්කේ,


1. ඬැහි අඬුව 2. හිරය 3. ටෙස්ටරය

(36) දඬු මගින් පැළ ලබා ගත හැකි ශාක වන්නේ,

1. නිවිති, මිරිස්, බතල 2. නිවිති, මුරුංගා, මඤ්ඤොක්කා

3. බතල, තක්කාලි, මෑ

(37) මෙමගින් දක්වා ඇත්තේ,



1. කුරුම්බැට්ටි මැෂිම

2. බඹර කරත්තය

3. කැටපෝලය

(38) ජලය පිරිසිදු කර ගත හැකි ක්‍රමයක් නොවන්නේ,

1. උණු කිරීම. 2. සිසිල් භාජනයක දැමීම.

3. ක්ලෝරීන් දැමීම.

(39) වලවේ ගඟ හා මැණික් ගඟ මුහුදට එක්වන්නේ,

1. මාතර - තිස්සමහාරාමය 2. අම්බලන්තොට - යාල

3. ගාල්ල - කළුතර

(40) කිතුණු බැතිමතුන්ගේ ආගමික උත්සව පිළිවෙළින් දක්වා ඇත්තේ,

1. රාමසාන් - නත්තල 2. පාස්කු - මහසිකුරාදා

3. තෛපොංගල් - පාස්කු

(41) ජලයේ දියවූ පසු භාජනයේ පතුලේ තැන්පත් වන්නේ,

1. ලුණු 2. මැටි 3. පොල්තෙල්

(42) ජලය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ජලය සුදු පාටය. 2. ජලයට හැඩයක් ඇත.

3. පිරිසිදු ජලයට වර්ණයක් නැත.

(43) පොදු ප්‍රවාහන ක්‍රම ආරක්ෂා කර ගැනීමට අපට කළ හැකි දෙයක් වන්නේ,

1. ආසන කුරුටු ගෑම.

2. අනිවාර්යයෙන්ම ටිකට් පතක් මිලදී ගැනීම.

3. වාහනවල විවිධ දේ ලිවීම.

PAPERMASTER.LK

(44) උණු කරගත් පාන වර්ග පිළිගැන්වීමේ දී වඩාත් සුදුසු වන්නේ,

1. වීදුරු 2. අඬුව සහිත පීරිසි කෝප්ප

3. අඬුව රහිත කෝප්ප

(45) ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යැවීමේ දී අනිවාර්යෙන්ම ලිපියෙහි අඩංගු විය යුත්තේ,

1. ලිපිය යවන්නා 2. ලිපියේ අඩංගු කරුණු

3. ලිපිය ලබන්නා සහ යවන්නා

(46) 'ජාතික නාමල් උයන' පිහිටා ඇත්තේ,

1. මධ්‍යම පළාතේ 2. උතුරු මැද පළාතේ

3. නැගෙනහිර පළාතේ

(47) ආහාරවල පිරිසිදුකම හා ආරක්ෂාකාරී බව පවත්වා ගැනීමෙන් අපට ඇතිවන අවාසිදායක තත්ත්වයක් නොවන්නේ,

1. ලෙඩ රෝග වැළඳීම. 2. දෛනික කටයුතුවලට බාධා වීම.

3. කාලය ඉතිරි කර ගැනීමට හැකි වීම.

(48) මේසය මත ඇති චුම්භකයකට ඇද ගන්නා ද්‍රව්‍යයක් වන්නේ,

1. ඇල්පෙනෙත්තක් 2. කුඩා කඩදාසි කැබලි

3. ප්ලාස්ටික් පෑනක්

(49) අතීතයේ මිනිසුන් මෙම උපකරණය උපයෝගී කර ගනිමින් ගත් ප්‍රයෝජනයකි.




1. ධාන්‍ය කෙටීම සඳහා

2. මිරිස් ඇඹරීම සඳහා

3. පිටි කෙටීම සඳහා

(50) රූපයෙන් පෙනෙන ශාක පත්‍රය වන්නේ,



1. කැන්ද

2. හබරල

3. කෙටල

PAPERMASTER.LK

(51) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. පුර පසළොස්වක පොහොය දින පූර්ණ චන්ද්‍රයා දැකිය නොහැකිය.

2. අටවක දින පූර්ණ දැකිය හැක.

3. අහසෙහි සඳ දකින්නට නොමැති දින අමාවක වේ.

(52) ළමා හිංසනය පිළිබඳ දැනුම් දීමට ඇති කෙටි දුරකථන අංකය වන්නේ,

1. 1929 2. 1919 3. 1938

(53) නොගැළපෙන සත්ත්ව කාණ්ඩය වන්නේ,

1. හිරවා - ගෙම්බා - සිංහයා 2. පූසා - බල්ලා - ගවයා

3. වඳුරා - මුවා - ගෝනා

(54) 'හෙළයේ මහා ගාන්ධර්වයා' යන නාමයෙන් හඳුන්වන්නේ,

1. ගාමිණී ෆොන්සේකා මහතා 2. පණ්ඩිත් අමරදේවයන්

3. එච්.ආර්. ජෝතිපාල

(55) දිග මැනීමේ ඒකකයේ කුඩා ම ඒකකයේ සිට විශාලම ඒකකය දක්වා පිළිවෙළින් ,

1. මීටර්, කිලෝමීටර්, සෙන්ටිමීටර්, මිලිමීටර්

2. මිලිමීටර්, සෙන්ටිමීටර්, මීටර්, කිලෝමීටර්

3. මීටර්, කිලෝමීටර්, මිලිමීටර්, සෙන්ටිමීටර්

(56) මෙම සලකුණෙන් දක්වනු ලබන්නේ,



1. වැසිකිළිය


2. පොලිස් ස්ථානය


3. ආපණශාලාව

PAPERMASTER.LK

(57) සුළඟ මගින් ව්‍යාප්ත වන ගම්මාලු බීජය තෝරන්න.







1. 2. 3.

(58) කුඩා දරුවෙකුගේ පෝෂණය පිළිබඳව උපදෙස් ලබා ගැනීමට වඩාත් සුදුසු වන්නේ, පහත පුද්ගලයන් අතරින් කවරෙකුගෙන්ද?

1. පවුල් සෞඛ්‍ය සේවිකාව

2. හෙදිය

3. පන්තිභාර ගුරුතුමිය

(59) වාහනයක් නතර කිරීමට තිරිංග යෙදූ විට දැල්වෙන ලද සංඥා ලාම්පුවේ ආලෝකය වන්නේ,

1. සුදු 2. රතු 3. අවර්ණ

(60) මෙම සංගීත භාණ්ඩය,



1. සුසිර

2. ආතත

3. තත්

PAPERMASTER.LK